www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ වඩා හොඳ පහසුකම් ඉල්ලා සිටිති

## Sri Lankan university students demand better facilities

**සුරංග සිරිවර්ධන සහ කපිල ප්‍රනාන්දු විසිනි.**

**2009 ජුලි 17**

**මේ** මස 8 වන දා කොළඹ නගරයට කි.මී. 162 ක් නැගෙනහිරින්, බෙලිහුල්ඔය පිහිටි සබරගමුව විශ්වවිද්‍යාලයේ සියලු පීඨ වල 2,000 ට ආසන්න සිසුන් විශ්වවිද්‍යාල පරිශ්‍රය තුල විරෝධතාවයක නිරත විය. දේශන ශාලා, නේවාසිකාගාර, විද්‍යාගාර, ආපන ශාලා සහ ක්‍රීඩා පිටි යනාදී මූලික පහසුකම් සඳහා වූ ඉල්ලීම් 16 ක් ඉදිරිපත් කලේ ය.

විරෝධතාවය පැවැත්වූයේ නිසි අධ්‍යාපනයක් සඳහා අවශ්‍ය මූලික පහසුකම් නොමැති වීම මත ජුලි 01 වන දා සිට පන්ති වර්ජනය කරමින් සිටින සමාජ විද්‍යා හා භාෂා පීඨයේ සිසුන්ට සහාය දැක්වීම පිනිස ය. මෙම විරෝධතාවය මහින්ද රාජපක්ෂ ආන්ඩුවේ අධ්‍යාපන කප්පාදුවට එරෙහිව ශිෂ්‍යයන් සහ තරුනයන් අතර වැඩෙන විරෝධතාවයේ ප්‍රකාශනයකි.

1995 ස්ථාපිත සබරගමුව විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෝ 3,000 කට ආසන්න ප්‍රමානයක් අධ්‍යාපනය ලබති. සබරගමුව විශ්වවිද්‍යාලය ඇතුලු තවත් විශ්වවිද්‍යාල 6 ක් 1990 දශකයේ මැදභාගයේ විවෘත කරනු ලැබුයේ විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලැබූ නමුත් ප්‍රමානවත් විශ්වවිද්‍යාල පහසුකම් නොමැතිකමින් එය අහිමි වූ ශිෂ්‍යයින්ගේ සහ දෙමාපියන්ගේ විරෝධතාවලින් පසුව ය.

නව විශ්වවිද්‍යාල හදිසියේම පිහිටුවනු ලැබුවේ වෙනත් අරමුනු සඳහා ඉදිකල ගොඩනැගිලිවලය. උදාහරනයක් ලෙස සබරගමුව විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරිශ්‍රය පෙර දී භාවිත කලේ සමනල වැව විදුලිබල ව්‍යාපෘතියේ කම්කරුවන්ගේ නාවාතැන් සඳහා ය. 2007 වන තෙක් ව්‍යවහාරික විද්‍යා පීඨය පිහිටා තිබුනේ ප්‍රධාන පරිශ්‍රයට කි.මී. 100 ක් පමන ඈතින් පිහිටි බුත්තල ප්‍රදේශයේ ය. එය වරක් ආදර්ශ නිවාස යෝජනා ව්‍යාපෘතියක (ගම් උදාව) භාවිතා කරන ලද අත්හල ගොඩනැගිලිවල පවත්වාගෙන යන ලදී.

අලුත් විශ්වවිද්‍යාල ඉදිකර තිබුන ද මේ වසරේ සිසුන් 100,000 ක් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබුව ද අවස්ථාව හිමිවූයේ ඉන් 20,000 කට පමන ය. ජුලි 8 වන දා *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* සහ සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ ව්‍යාපාරයේ කන්ඩායමක් විරෝධතාවයේ යෙදී සිටි සිසුන් හමු විය.

සමාජවිද්‍යා හා භාෂා පීඨයේ ශිෂ්‍යාවක් වන සමන්ති විශ්වවිද්‍යාලයේ පවත්නා තත්ත්වය පිලිබඳව කෝපයෙන් යුතුව කරුනු පැහැදිලි කලා ය. "අපේ පන්ති කාමර හරියට කුකුල් කූඩු වගේ" යැයි ඇය ප්‍රකාශ කලාය. "පුටු කැඩිලා, ලමයින්ට වෙනත් කාමරවලින් පුටු අරන් එන්න වෙනවා. දේශකයන් කොළඹ විශ්වවිද්‍යාලයෙන් අලුතින් බඳවා ගත්තා ඒත් මහාචාර්යවරු නෑ. ඒ ගොල්ලෝ මෙහේ එන්න කැමති නෑ, ප්‍රවාහන සහ නවාතැන් පහසුකම් නැති හින්දා වගේම ගොඩක් දුර හින්දා.

"'සමනල' හා 'සිංහරාජ' කියලා ප්‍රධාන නේවාසිකාගාර දෙකක් තියනවා. සමනල

නේවාසිකාගාරයේ ලමයින් 48 ක් ඉන්නවා. ඒත් නානකාමර දෙකක් විතරයි තියෙන්නේ. එක පුංචි කාමරයක ලමයි 8 ක් ඉන්නවා. ඒවායේ පාඩම් කල හැකි කාමර ඇත්තේ නෑ.

"2001 දී අලුත් ගොඩනැගිල්ලකට අමාත්‍ය මන්ඩල අනුමැතිය ලැබී 2006 දී ඒ සඳහා මුල්ගල තිබ්බ නමුත් ඒකේ වැඩ තාම සම්පූර්න නෑ. පන්ති කාමර ප්‍රමානවත් නැති නිසා ව්‍යවහාරික විද්‍යා පීඨයට රෑ 9 වෙනකනුත්, අපේ පීඨයට රෑ 7 වනකනුත් දේශන තියනවා. අපට හැම මාසයකම රු. 2,500 ශිෂ්‍යාධාරයක් ලැබුනත් ඒක කෑම වියදමටත් මදි. ආන්ඩුව නිදහස් අධ්‍යාපනය කප්පාදු කරමිනුයි ඉන්නේ."

භූ මැනුම් පීඨයේ දෙවන වසර ශිෂ්‍යාවක් ප්‍රකාශ කලේ තමන් අධ්‍යාපනය ලැබූ පාසලෙහි භෞතික විද්‍යාව සඳහා විද්‍යාගාර පහසුකම් තිබුන ද විශ්වවිද්‍යාලය තුල විද්‍යාගාර නොමැති බවයි. දේශන ශාලා ප්‍රමානවත් නොවන නිසා එක් වසරක සිසුන් ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා පිටත් කොට අනෙක් වසර තුන සඳහා දේශන පවත්වයි. පරිගනක පාඨමාලාව මේ වන තුරු විවෘත කොට නොමැත.

"අපේ නේවාසිකාගාරය විශ්වවිද්‍යාලයෙන් බද්දට ගත් නිවසක්. ඒ වගේ නේවාසිකාගාර 30 පමන තියනවා. අපේ කාමරේ 6 දෙනෙක් ඉන්නවා. ඒත් සමහර කාමරවල 8 හෝ 9 ක් ඉන්නවා. පැවිල්ල කාලෙට වතුර ලොකු ප්‍රශ්නයක්. අනිත් සනීපාරක්ෂක පහසුකනුත් ප්‍රමානවත් නැත" යි ඇය තවදුරටත් ප්‍රකාශ කලා ය.

"අපේ කැම්පස් එකට මූලික සැලැස්මක් අනුමත වෙලා තියනවා. නමුත් ප්‍රතිපාදන මදි නිසා ඒක තාම ක්‍රියාත්මක කරලා නෑ. ආන්ඩුව ප්‍රමුඛතාවය දුන්නේ යුද්ධයට. ඒ නිසයි විශ්වවිද්‍යාලවල අපට එවැනි දිලිඳු පහසුකම් තියෙන්නේ."

ශිෂ්‍යයන්ගේ විරෝධතාවයන්ට බලයට පැමිනි සෑම ආන්ඩුවක්ම සහ විශ්වවිද්‍යාල බලධාරීන් ප්‍රතිචාර දක්වා තිබෙන්නේ සිසුන්ට පහරදීම සහ බොරු පොරොන්දු දීම මගිනි. 2007 ඔක්තෝබර් මාසයේ දී ව්‍යාවහාරික විද්‍යා පීඨයේ සිසුන් බුත්තල රැඳී සිටීම ප්‍රතික්ෂේප කොට බෙලිහුල්ඔයට පැමිනිය ද ප්‍රධාන පරිශ්‍රයට එම පීඨය සම්බන්ධ කර ගැනීම විශ්වවිද්‍යාල බලධාරින් විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

කොලඹ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම ඉදිරිපිට ශිෂ්‍යයින් විසින් මාස 3 ක් රැඳී සිටිමින් කල විරෝධයෙන් පසුව රාජපක්ෂ ආන්ඩුව එය විසුරුවා හැරීම සඳහා පොලීසිය යෙදවූ අතර ශිෂ්‍යයන් තිදෙනෙකු අත්අඩංගුවට ගන්නා ලදී. පසුව එම පීඨය ප්‍රධාන පරිශ්‍රයට ගෙන ආව ද අප්‍රමානවත් පහසුකම් එලෙසින්ම පැවතිනි.

සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුන මගින් පාලනය කරන අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බල මන්ඩලය (අවිශිබම) ශිෂ්‍ය අරගල සීමා කිරීමට සහ එය කම්කරු පන්තියෙන් හුදකලා කිරීමට හැකි සෑම දේ ම කරමින් සිටී.

සබරගමුව විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සංගමයේ සභාපති අනුෂ්ක සුපුන් කුමාර *ලොසවෙඅ* ට ප්‍රකාශ කලේ "අපි අවිශිබම සමග විරෝධතාවයන්ගේ නිරත වනවා. අවිශිබම මෙන්ම අපි කරන්නේ 'ශිෂ්‍ය දේශපාලනය'.'' ශිෂ්‍ය ඉල්ලීම් සපුරාලීම සඳහා පෙර පැවති විරෝධතාවයන්ගේ අසාර්ථකභාවය පැහැදිලි කරන ලෙසට කල අභියෝගය තිබිය දී ම " අපි කම්කරුවන්ගේ දේශපාලනය කරන්නේ නෑ. අපි ඒක කලොත් අපට ශිෂ්‍යයන් දිනාගන්න බෑ." යයි ඔහු පිලිතුරු දුන්නේ ය.

අවිශිබම සහ ජවිපෙ නායකයෝ විශ්වවිද්‍යාලවල පවත්නා දිලිඳු තත්ත්වයට විශ්වවිද්‍යාල අධිකාරීන්ගේ නාස්තිය සහ දූෂනය හේතුවක් වී ඇති බවට දොස් පවරති. රාජ්‍ය දූෂනය සහ නාස්තිය මගින් කම්කරුවන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීමට එරෙහි වන්නේ යැයි උදක්ම කියා සිටින ජවිපෙ සහ එහි වෘත්තීය සමිති මගින් එවැනිම තර්කයක් ගොඩ නගා ඇත.

මෙම ප්‍රකාශයන් රාජපක්ෂ ආන්ඩුව විසින් දෙමල සුලුතරයට එරෙහිව වර්ගවාදී යුද්ධය සඳහා පුලුල් පරිමානයෙන් යුද වියදම් ඉහල දැමීම සඳහා සුභසාධන ව්‍යාපෘති, සහනාධාර, අධ්‍යාපනය සහ සෞඛ්‍ය සේවය සඳහා වූ අර මුදල් කපා දැම්මේය යන සත්‍යය වසන් කරනු ලබයි.

දෙමල විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊය) එරෙහි යුද ජයග්‍රහන තිබිය දී ම ආන්ඩුව හමුදා බලයේ ප්‍රමානය වැඩි කරමින් සිටී. මෙම බටකායයන් උතුරු නැගෙනහිර අඛන්ඩ වඩිලාගැනීම සඳහා සහ ශිෂ්‍යයන්ගේ හා කම්කරුවන්ගේ අරගල මර්දනය කිරීම සඳහා යොදවනු ඇත. ආන්ඩුව ලෝක අවපාතයේ බර සහ යුද වියදම් කම්කරු පන්තිය මත පැටවීම පිනිස "ජාතිය ගොඩනැගීමේ නාමයෙන්" "ආර්ථික යුද්ධයක්" මේ වන විට දියත් කර තිබේ.

ශිෂ්‍යයින් නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කර ගැනීම සඳහා සහ නිසි පහසුකම් ලබා ගැනීම සඳහා කම්කරු පන්තිය සමග ඔවුන්ගේ අරගලය ඒකාබද්ධ කල යුතුය. සියල්ලටමත් වඩා මින් අදහස් වන්නේ ධනපති සුලුතරයකගේ ලාභ අවශ්‍යතාවලට වඩා සියල්ලන්ගේ සමාජ අවශ්‍යාතාවයන් ඉටුවන අයුරින් සමාජය ප්‍රතිසංවිධානගත කිරීම සහ ධනවාදය මුලිනුපුටා දැමීමේ පදනම මත ජාත්‍යන්තර සමාජවාදී ක්‍රියාමාර්ගයකට හැරී ගැනීමයි. *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* සහ සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ ව්‍යාපාරය මගින් පමනක් වර්ධනය කරනු ලබන ඉදිරිදර්ශනය වන්නේ මෙයයි.

□ □□□.□□□□.□□□